එකම වරදක් සඳහා කාන්තා සහ පිරිමි දෙපාර්ශවයම සහභාගී වූ විටකදී පවා, එම වරදෙහි වගකීම කාන්තාව පිට පමණක් පටවමින් කාන්තාව සෘණාත්මකව ඉස්මතු කිරීම මාධ්‍ය ආචාර ධර්මානුකූලව ගැටළුකාරී බව Ethics Eye අපි නැවත නැවතත් පෙන්වා දී ඇත්තෙමු. කෙසේ වෙතත්, එය තවමත් මාධ්‍ය තුළ සිදුවනු දක්නට ලැබීම කණගාටුවට කරුණක් බවද අපි පවසමු.

"ඉන්ධන පෝලිමේ සිටි කතුන් තුනක් අතුරුදන්, තවත් කතක් සැමියා ගෙදර යවා අනග රඟුමේ" යන සිරස්තලයෙන් යුතුව අරුණ පුවත්පතේ (ජුනි 27, 2022) පළවූ පුවත් වාර්තාව ඊට උදාහරණයක් වේ. මෙම පුවතට අනුව, ඉන්ධන පෝලිම් වල සිටි කාන්තාවන් තිදෙනෙකු "අතුරුදන් වී" ඇති බව පොලීසිය ප්‍රකාශ කරන අතර, පුවතේ වැඩිදුරටත් සඳහන් වන්නේ තවත් කාන්තාවක් සැමියා රවටා වෙනත් තරුණයෙකු සමඟ කාලය ගත කර ඇති සිදුවීමක් පිළිබඳව වේ.

2) පුවත් වාර්තාවේ දෙවනුව දැක්වෙන පුවතේ සඳහන් කත "අනග රඟුමේ" යැයි පැවසීමත්, "පෝලිමේ සිටි තම සැමියා උපක්‍රමශීලීව නිවසට යවා ඇය රාත්‍රී කාලයේ පෝලිමේ රැඳී සිටි බවත්" පැවසීමත්, මෙම පුවත් වාර්තාව තුළ එම කාන්තාව පමණක් වරදකරු ලෙසින් ඉස්මතු කොට දැක්වීමත් ඔස්සේ, කාන්තාවට පමණක් වරද පැටවීමක් මෙහි සිදුවී ඇතැයි ඔබ නොසිතන්නේ ද? එසේ නම් එය ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කොට ගත් කොන් කිරීමක් නොවන්නේ ද?

ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගනිමින් කාන්තාවන් කොන් කරනා වාර්තාකරණයෙන් වළකිමු!